G4

දිවයිනේ ජාතික හා පළාත් පාසල්වල පවතින සිංහල, දෙමළ හා ඉංග්‍රීසි මාධ්‍ය ගුරු පුරප්පාඩු සඳහා රජයේ සේවයේ නියුතු උපාධිධාරීන් හා රජයේ සේවයේ නියුතු නොවන සෙසු උපාධිධාරීන් ශ්‍රී ලංකා ගුරු සේවයේ 3-I (අ) ශ්‍රේණියට බඳවා ගැනීම - 2026

උක්ත බඳවා ගැනීමට අදාළව පළ කරන ලද ගැසට් නිවේදනයන් අනුව විභාග කොමසාරිස් ජනරාල් විසින් 2026.05.24 දිනැතිව පවත්වන ලිඛිත තරග විභාගයන්ගේ ප්‍රතිඵල මත සම්මුඛ පරීක්ෂණ සඳහා සුදුසුකම් ලබා ඇති අයදුම්කරුවන්ගේ නාම ලේඛන, අයදුම්කරුගේ ස්ථිර පදිංචි ලිපිනයට අදාළ පළාත පදනම් කරගනිමින් අයදුම්කරුවන් විසින් ඉල්ලුම් කරන ලද මාධ්‍යයට අනුව, වෙන් වෙන් ලේඛන වශයෙන් මෙම අමාත්‍යාංශ වෙබ් අඩවිය ඔස්සේ මෙන්ම එක් එක් පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභා/පළාත් අධ්‍යාපන අමාත්‍යාංශ වෙබ් අඩවි ඔස්සේ 2026.10.14 දින සිට ප්‍රදර්ශනය කරන ලදී. එකී ලේඛනය ප්‍රකාරව සම්මුඛ පරීක්ෂණ සඳහා පෙනී සිටීමට සුදුසුකම් ලද අයමදුම්කරුවන් සඳහා පහත විශේෂ නිවේදන ලබාදීමට අපේක්ෂා කෙරේ.

1. එක් එක් අයදුම්කරු සඳහා සම්මුඛ පරීක්ෂණ පැවැත්වෙන දිනය/වේලාව හා ස්ථානය දක්වන ලේඛනය මෙම අමාත්‍යාංශයේ නිල වෙබ් අඩවියෙහි **"උපාධි ගුරු බඳවාගැනීමේ සම්මුඛ පරීක්ෂණ කාලසටහන-2026'** මැයෙන් පළ කරනු ලබයි. සම්මුඛ පරීක්ෂණය සඳහා සුදුසුකම් ලත් අයදුම්කරුවන්ගේ නම් තමන් අයදුම්පත්‍රයේ දක්වන ලද තමන්ගේ ස්ථිර පදිංචි පළාතට අදාළව, ඉල්ලුම් කරන ලද ගැසට් නිවේදන අනුව හා විභාගයට ඉල්ලුම් කරන ලද භාෂා මාධ්‍ය අනුව පිළිවලින් දක්වා ඇත. අයදුම්කරුවන් හට සිය ජාතික හැඳුනුම්පත් අංකය/විභාග අංකය යොදා එකී ලේඛන අනුව සම්මුඛ පරීක්ෂණ තොරතුරු පරීක්ෂා කරගත හැකිය;

2. සියලුම අයදුම්කරුවන් තම නම ඇතුලත් ලේඛන භාගත කිරීමේදී ඒ සමගම දක්වා ඇති උපදෙස් ඇතුලත් **G3** උපදෙස් ලේඛනයද භාගත කරගෙන එකී උපදෙස් පරිදි සම්මුඛ පරීක්ෂණය සඳහා ඉදිරිපත්වීමේදී ඉදිරිපත් කළ යුතු ලේඛන සූදානම් කරගත යුතු අතර, ඒ සමග දක්වා ඇති පහත ලේඛනද භාගත කරගෙන ලබා දී ඇති උපදෙස් පරිදි කටයුතු කළ යුතුය;

   F2- පූර්ණ කාලීන ආබාධිත තත්ත්වය තහවුරු කිරීම සඳහා වන වෛද්‍ය පරීක්ෂණ වාර්තාව (පූර්ණකාලීන ආබාධිත ගණය යටතේ අයදුම් කර ඇති සියලු දෙනාට මෙය අදාළ වේ)

   මෙම වෛද්‍ය පරීක්ෂණ ආකෘතිය අනුව රජයේ රෝහලක වෛද්‍යවරයෙකු /මණ්ඩලයක් මගින් වෛද්‍ය පරීක්ෂණයට යොමු විය යුතුය. එකී අයදුම්කරුවන් යොමු විය යුතු රෝහල ඉදිරියේදී අයදුම්කරු අමතා දැනුම් දෙනු ලබන අතර, එකී දිනයට හා වේලාවට දැනුම්දුන් පරිදි අයදුම්කරු අදාල රෝහල වෙත යොමු වී ලබා ගන්නා වාර්තාව සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය වෙත නියමිත දිනට අයදුම්කරු අදාළ රෝහල වෙත යොමු විය යුතුය.

   F3- පොලිස් නිෂ්කාශන වාර්තාව ඉල්ලීම් කිරීම සඳහා වන ලිපිය - (මෙම ලිපිය රාජ්‍ය සේවයේ නියුතු නොවන උපාධිධාරීන් යටතේ අයදුම්කර ඇති අයදුම්කරුවන් සඳහා පමණක් අදාළ වේ.)
   එම අයදුම්කරුවන් තමන්ට ආසන්නතම පොලිස් ස්ථානය වෙත මෙම ලිපිය මගින් ඉල්ලීමක් සමග එම ලිපියේ දක්වන ලද ලේඛන ඉදිරිපත් කර ඇගිළි සළකුණු පොලිස් ස්ථානය වෙත ලබාදී, පොලිස් නිෂ්කාශන වාර්තාව අයදුම් කළ යුතුය. සම්මුඛ පරීක්ෂණයේදී රාජ්‍ය සේවයේ නියුතු නොවන අයට අදාළ සියලුම සම්මුඛ පරීක්ෂණලාභින් මෙම වාර්තාව සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය වෙත ඉදිරිපත් කිරීම අනිවාර්ය බැවින්, 2026.11.07 දක්වා කාලය තුළ අදාළ පොලිස් ස්ථානය වෙත මෙම ඉල්ලීම ඉදිරිපත් කිරීමට අයදුම්කරු වගබලාගත යුතු

අතර, ඒ අනුව අදාළ පොලිස් ස්ථානය විසින් මෙම වාර්තා 2026.11.07 දිනෙන් පසුව යෙදෙන දිනක සිට සම්මුඛ පරීක්ෂණයට ඉදිරිපත් කිරීමට හැකි වන පරිදි අයදුම්කරු වෙත නිකුත් කිරීමට කටයුතු කරනු ඇත. (මේ සම්බන්ධව දැනටමත් පොලිස්පතිතුමන් විසින් පොලිස් ස්ථාන වෙත අවශ්‍ය දැනුවත් කිරීම් සිදුකර ඇත.)

F4- සේවය සනාථ කිරීමේ ලිපිය - රාජ්‍ය සේවයේ නියුතු උපාධිධාරීන්ට පමණක් අදාළ වේ.
අංක 2474/18 හා 2026.02.02 ගැසට් නිවේදනය අනුව රාජ්‍ය සේවයේ නියුතු උපාධිධාරීන් ලෙස අයදුම්කර ඇති අයදුම්කරුවන් මෙම ලේඛනය සිය ආයතන ප්‍රධානී මගින් සම්පූර්ණ කර සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය වෙත ඉදිරිපත් කළ යුතුය (රාජ්‍ය සේවයේ නියුතු නොවන සෙසු උපාධිධාරීන් යටතේ අයදුම්කර ඇති රාජ්‍ය සේවයේ නියුතු උපාධිධාරීන් වේ නම් ඔවුන් ද ඉහත දක්වන ලද **F3 වාර්තා හා ඊට අමතරව** මෙම **F4** ආකෘතිය ප්‍රකාර සේවය සනාථ කිරීමේ සහතිකය ද සම්මුඛ පරීක්ෂණයට ඉදිරිපත් කළ යුතුය.

3. සම්මුඛ පරීක්ෂණ සඳහා සුදුසුකම්ලාභීන්ගේ නාමලේඛනය දක්වමින් මෙම අමාත්‍යාංශයේ නිල වෙබ් අඩවියෙහි 2026.10.14 පළ කල නාම ලේඛනයේ සිය නම ඉදිරියෙන් දක්වන ලද විෂය අංක සඳහන් සියලුම විෂයන් සඳහා අයදුම්කරු සුදුසුකම් ලබා ඇති බැවින්;
   A. එහිදි සුදුසුකම් ලද එක් එක් විෂය අංක සමග;
      P- ලෙස දක්වා ඇත්නම් ඔබ පළාත් පාසල් හි පවතින එකී විෂය සඳහා වන පුරප්පාඩු සඳහාත්,
      N- ලෙස දක්වා ඇත්නම් ඔබ ජාතික පාසල් හි පවතින එකී විෂය සඳහා වන පුරප්පාඩු සඳහාත්,
      NP- ලෙස දක්වා ඇතනම් ඔබ ජාතික පාසල් සහ පළාත් පාසල් හි පවතින එකී විෂය සඳහා වන පුරප්පාඩු සඳහාත් සුදුසුකම් ලබා ඇති බවත් සලකා සම්මුඛ පරීක්ෂණයට පැමිණීමේදී අදාළ ගැසට් නිවේදන ප්‍රකාරව සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය විසින් ඔබ ප්‍රායෝගික පරීක්ෂණයට තෝරාගනු ලැබුවහොත් අදාළ ඉදිරිපත් කිරීම් සඳහා සූදානම්ව පැමිණිය යුතුය,
   B. එකී සුදුසුකම් ලද සියලුම විෂයන් සඳහා අදාළ වන සියලුම පාසල් ගණ සඳහා පෙන්නුම් කරන පුරප්පාඩු පාසල් සඳහා ඉදිරියේදී ලිපි මගින් ලබාදෙනු ලබන උපදෙස් පරිදි මනාපය පළ කිරීම් සිදුකළ යුතුය;

4. සම්මුඛ පරීක්ෂණය සඳහා පෙනී සිටීමට සුදුසුකම්ලත් සියලුම සුදුසුකම්ලාභීන් වෙත අයදුම්පත්‍රයේ දක්වන ලද තමන්ගේ ස්ථිර පදිංචි ලිපිනය වෙත **සම්මුඛ පරීක්ෂණයට කැඳවීමේ ලිපි 2026.11.01 දින සිට තැපැල් මගින්ද යොමු කෙරෙන අතර**, එකී ලිපිය මගින් දක්වා ඇති පරිදි සම්මුඛ පරීක්ෂණ සඳහා සූදානම්ව පැමිණීම අනිවාර්ය වේ;

5. සම්මුඛ පරීක්ෂණය සඳහා ඉදිරිපත් කළ යුතු බවට දක්වා ඇති G3 උපදෙස් මගින් දක්වා ඇති සියලුම ලේඛන සම්මුඛ පරීක්ෂණ අවස්ථාවේදීම සම්මුඛ පරීක්ෂණ මණ්ඩල වෙත ඉදිරිපත් කළ යුතු අතර, පසු අවස්ථාවන්හිදී ඉදිරිපත් කරනු ලබන ලේඛන සලකා බලනු නොලැබේ.

6. තවද, මෙම තරඟ විභාගය 2023 වසරේ පැවැත්වීම සඳහා අංක 2317 හා 2023.01.27 දිනැති ගැසට් නිවේදනයට අදාළව අයදුම්කල අයදුම්කරුවන්ට; "පළාත් පාසලක්" හෝ "ජාතික පාසලක්" යන දෙකෙන් එකක් ඉල්ලීමට තිබූ අවස්ථාව ඉක්මවා තවදුරටත් "පළාත් පාසලක් හෝ ජාතික පාසලක්" යන තේරීමක් පැවතීම මත ; හා එක් අයදුම්කරුවකුට උපරිම විෂයයන් 4ක් අයදුම්කිරීමට පැවතීම මත ලැබී තිබූ අවස්ථා අහිමි නොවන පරිදි හා එකී ගැසට් නිවේදනය සම්බන්ධව අධිකරණ ක්‍රියාමාර්ග වලට එළඹීම මත අවස්ථාව උදා කරගත් අනෙකුත් උපාධිධාරීන් හටද එකී අවස්ථා හිමි වන පරිදි මෙම තරඟ විභාග සඳහා නැවත අයදුම් කරන අයහටද එකී අවස්ථා හිමිවන පරිදි මෙම තරඟ විභාග සඳහා වන ගැසට් නිවේදන පළ කිරීම මත මෙම ලිඛිත තරඟ විභාගයේදී ඉහලම ලකුණු ලද අය එකම විෂයට අදාළව ජාතික මෙන්ම පළාත් පාසල් සඳහා සම්මුඛ පරීක්ෂණ සුදුසුකම් ලබා ඇති අවස්ථා මෙන්ම, එකම අයදුම්කරු එකම පාසල් වර්ගයක් යටතේ

විෂයන් කිහිපයකට සුදුසුකම් ලබන අවස්ථා විශාල වශයෙන් පවතී. ඒ හේතුවෙන් ඉදිරියේදී මෙවැනි අයදුම්කරුවන් සුදුසුකම් ලැබුවහොත් තෝරාගන්නා එක් විෂයකට පමණක් පත් කිරීමේදී සම්පූර්ණ නොවන ඉතිරි පුරප්පාඩු මොනවාද යන්න මෙම අදියරේ කැඳවන අයදුම්කරුවන්ට පත්වීම් ලබාදීමෙන් අනතුරුව හඳුනාගෙන ඉදිරි අදියරවලදී එම පුරප්පාඩු සඳහා ලිඛිත විභාගය සමත් මීළගට ඉහලම ලකුණු ලබා ඇති මෙම අදියරෙහිදී පත්වීම් නොලබන හා මීලඟට සුදුසුකම් සහිත අයදුම්කරුවන් කැඳවීමට අපේක්ෂා කරයි.

නාලක කලුවැව
ලේකම්